# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1773/40 – 2012 අගෝස්තු 30 වැනි බ්‍රහස්පතින්දා – 2012.08.30**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/15/10/2010.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම.

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියැවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2012 ජනවාරි මස 04 වැනි දින අංක 1739/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011 දෙසැම්බර් මස 23 වැනි දින දරන නියෝගයෙන්,

එක් පාර්ශවයක් වශයෙන්

ලංකා ආරක්ෂක සේවා, සංගමය, අංක 103, පී. එස්. පෙරේරා මාවත, මාම්පේ, පිළියන්දල.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත පාර, කොළඹ 10.

අතර පවත්නා 2011 නොවැම්බර් මස 11 වැනි දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ටී. පියසෝම මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2011 දෙසැම්බර් මස 23 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 අගෝස්තු මස 09 වැනි දින,
කොළඹ දී ය.

09 – 434/1

මගේ අංකය: IR/15/10/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

එක් පාර්ශවයක් වශයෙන්

ලංකා ආරක්ෂක සේවා, සංගමය, අංක 103, පී. එස්. පෙරේරා මාවත, මාම්පේ, පිළියන්දල.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 77 හි ටී. පියසෝම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 අගෝස්තු මස 09 වැනි දින,

මගේ අංකය: IR/15/10/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශවයක් වශයෙන්

ලංකා ආරක්ෂක සේවා, සංගමය, අංක 103, පී. එස්. පෙරේරා මාවත, මාම්පේ, පිළියන්දල.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

**ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

01. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ආරක්ෂක අංශ සඳහා නිලධාරීන් බඳවා ගැනීමේදී පුරප්පාඩු පිරවීමේදී පිටතින් සේවකයින් බඳවා ගැනීම තුළ සුදුසුකම් ලත් ආයතනයේ සේවකයින්ට අවස්ථාවක් නොලැබීමෙන් අසාධාරණයක් සිදුවී ඇද්ද යන්න හා එසේ වී නම් ඔවුනට කුමන සහන හිමිවිය යුතුද යන්න.

02. ආරක්ෂක නියාමක 1 වෙනි ශ්‍රේණියේ නිලධාරීන් විශාල පිරිසක් සඳහා උසස්වීම් නොලැබීම හා සුදුසුකම් සපුරා ඇතත් උසස්වීම නොලබා ඔවුන් සිටි ශ්‍රේණියේම විශ්‍රාම යෑමට සිදුවීම නිසා අසාධාරණයක් සිදුව ඇද්ද යන්න හා එසේ වී නම් ඔවුනට කුමන සහන හිමිවිය යුතුද යන්න.

03. සමහර ආරක්ෂක නිලධාරීන්ට පිළිගත් උසස්වීම් පටිපාටිය උල්ලංඝනය කරමින් උසස්වීම් ලබා දීම හේතුවෙන් සුදුසුකම් සහිත සෙසු ආරක්ෂක නිලධාරීන්ට අසාධාරණයක් සිදුවී ඇද්ද යන්න එසේ වී නම් ඔවුනට කුමන සහන හිමිවිය යුතුද යන්න.

04. සුදුසුකම් ලබා ඇති ආරක්ෂක නිලධාරීන්ට විශ්‍රාම යෑමට පෙර ආරක්ෂක නියාමක 1 වැනි ශ්‍රේණියේ නිලධාරීන්ට හිමි උසස්වීම් ලබා නොදීම නිසා අසාධාරණයක් සිදුවී ඇද්ද යන්න හා එසේ වී නම් ඔවුනට හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 අගෝස්තු මස 03 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 – 434/2

මගේ අංකය: IR/21/40/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණ පිළිබඳව–

එක් පාර්ශවයක් වශයෙන්

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 12/2, වීර මාවත, ශ්‍රී සුභූතිපුර, බත්තරමුල්ල.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්

හොල්සිම් ලංකා ලිමිටඩ්, අංක 413, ආර්. ඒ. ද මැල් මාවත, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බොරලැස්ගමුව, අබේරත්න මාවත, අංක 28 හි, එස්. කාරියවසම් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 අගෝස්තු මස 09 වැනි දින,

මගේ අංකය: IR/21/40/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශවයක් වශයෙන්

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 12/2, වීර මාවත, ශ්‍රී සුභූතිපුර, බත්තරමුල්ල.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්

හොල්සිම් ලංකා ලිමිටඩ්, අංක 413, ආර්. ඒ. ද මැල් මාවත, කොළඹ 03.

ඉහත පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –

හොල්සිම් ලංකා ලිමිටඩ් ආයතනයේ නිෂ්පාදන මෙහෙයුම් කටයුතු වල නියැලෙන ෆෝමන් හා සුපර්වයිසර් යන සේවා කාණ්ඩවල සුපරීක්ෂක (14 වන ශ්‍රේණියේ) සේවකයන්ට ලබාදෙන රු. 15,000/-ක දීමනාව නිෂ්පාදන මෙහෙයුම් කටයුතුවලට දායකත්වය දැක්වීම යන පදනම මතම එම සේවා කාණ්ඩවලට අයත් පහළ ශ්‍රේණිවල සේවකයන්ට ලබා නොදීම සාධාරණ ද නැතහොත් ඔවුන්ට ලබා දිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 අගෝස්තු මස 03 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 - 435

මගේ අංකය: IR/10/70/2010.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව–

එක් පාර්ශවයක් වශයෙන්

අරුණ ප්‍රියංග මුදන්නායක මහතා, "කුඩාමල", හලාවත පාර, වෙන්නප්පුව.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්

ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී., ප්‍රධාන කාර්යාලය, ලෝටස් පාර, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 08, මාතා පාර, මැනිං ටවුන් නිවාස යෝජනා ක්‍රමය, අංක බී 9 හි, එන්. ඒ. ජයවික්‍රම මහත්මිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 අගෝස්තු මස 15 වැනි දින,

මගේ අංකය: IR/10/70/2010.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

එක් පාර්ශවයක් වශයෙන්

අරුණ ප්‍රියංග මුදන්නායක මහතා, "කුඩාමල", හලාවත පාර, වෙන්නප්පුව.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්

ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී., ප්‍රධාන කාර්යාලය, ලෝටස් පාර, කොළඹ 01.

**අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ –**

ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී. ආයතනයේ සේවය කළ අරුණ ප්‍රියංග මුදන්නායක මහතා වෙනුවෙන් 599/09 හා 608/09 අංක යටතේ විනය පරීක්ෂණ දෙකක් එකවරම ඒකපාර්ශිකව තැබීම.

සේවකයා මානසික ආතතියකින් පෙළෙන බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කරමින් විනය පරීක්ෂණයකට සහභාගි වීමට නොහැකි බව දන්වා තිබියදීත් වරදකරු කොට විනය හේතු මත සේවයෙන් පහ කිරීම,

එම ආයතනය විසින් සේවකයාගේ අසනීප තත්වය පිළිබඳ සොයා බැලීමට වෛද්‍ය මණ්ඩලයක් 2010.01.20 වැනි දින කැඳවා තිබියදීත් ඊට පෙර සේවය අවසන් කිරීම හා

විනය තීරණ ගත් නිලධාරියා වෙතම අභියාචනා ඉදිරිපත් කිරීමට සලස්වා තිබීම.

යන කාරණා හේතුවෙන් පැමිණිලිකරුට යම් අගතියක් සිදුවූයේ ද යන්න හා එසේ වූයේ නම් ඔහුට කුමන සහන හිමිවිය යුතු ද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

09 - 436

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.